09. ඔබ යම් කිසි වරදකට උසාවියේ වරදකරු වී ඇත්ද ?
පිළිතුර ඔව් නම් විස්තර සපයන්න.
.................................................................................................................................
.................................................................................................................................

10. පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් මේ සමඟ අමුණා ඇත්නම් "√" සළකුණ යොදන්න.

| | | |
|---|---|---|
| (i) | උප්පැන්න සහතිකය; | |
| (ii) | අධ්‍යාපන සහතික; | |
| (iii) | පදිංචිය පිළිබඳ ග්‍රාම නිලධාරි සහතිකය; | |
| (iv) | මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්. (එකක් ග්‍රාම නිලධාරිවරයාගෙන් විය යුතුය); | |
| (v) | වෘත්තිය පිළිබඳ සහතික; | |
| (vi) | සේවා සහතිකය. (දැනටමත් රාජ්‍ය පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට පමණි.) | |

ඉහත අංක 01 සිට 10 දක්වා මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙම තොරතුරු වැරදි බව ඔප්පු වුවහොත් මා මෙම රැකියාවට නුසුදුස්සෙකු වන බවත්, සහතික වෙමි.

.................................
අයදුම්කරුගේ අත්සන.

**සේවා සහතිකය**

මෙම ඉල්ලුම්කරු වන .................................................................................................................... මයා/ මිය මෙම කාර්යාලයේ ................................................................. කු වශයෙන් අනියම් / ආදේශක / .............................................................. තනතුරක ............................................ ක සේවයක් සම්පූර්ණ කර ඇති බව මෙයින් සහතික කරමි.

.............................................
දෙපාර්තමේන්තු/ ආයතන ප්‍රධානියා
අත්සන/ නිල මුද්‍රාව.

09-275

---

**මහනුවර මහා නගර සභාව**

මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත සේවාවන් ලබා ගැනීම

මහනුවර මහා නගර සභාවේ සේවා අවශ්‍යතාවය මත ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත පහත සේවාවන් ලබා ගැනීම සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. ඒ අනුව අයදුම්පත් බහාලන කවරයෙහි වම්පස ඉහළ කෙළවරෙහි සපයනු ලබන සේවාවේ නාමය සඳහන් කර 2026.10.09 දිනට ප්‍රථම නාගරික කොමසාරිස්, මහනුවර මහා නගර සභාව, මහනුවර යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

**01. රියදුරු සේවාව ලබාගැනීම සඳහා**
**(ට්‍රැක්ටර් රථ රියදුරු/ලොරි රථ රියදුරු)**

1. තනතුරු සංඛ්‍යාව : තනතුරු 07
2. වයස : සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.
3. දීමනාව : දෛනික දීමනාව රු. 2019.33 කි. (මාසයකට අවම දින 25ක් රාජකාරි කළ යුතුය)
4. අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිනසෙයින් සම්මාන 2ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එකවර සමත්වී තිබිය යුතුය.

5. වෘත්තීය සුදුසුකම් : මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් ජනරාල් විසින් නිකුත් කළ එක් එක් තනතුර සඳහා අදාල වන මෝටර් රථ පැදවීමේ බලපත්‍රයක් ලබා තිබීම.

තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන බර ට්‍රේලර් සහ මගීන් 32ට නොවැඩි සංඛ්‍යාවක් ගෙනයා හැකි බස් රථ සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම. (අයදුම්පත්‍ර කැඳවන දිනට වසර 03කට පෙර අවම වශයෙන් මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද A පන්තියේ වාහන බලපත්‍රයක් හෝ නව රියදුරු බලපත්‍රය අනුව B පන්තියේ බලපත්‍රයක් ලබා තිබීම

6. පළපුරුද්ද : මෝටර් රථ පැදවීමේ බලපත්‍රය ලැබීමෙන් පසු අවම වසර 03ක පළපුරුද්ද ලබා තිබීම (පළපුරුද්ද සහතික මඟින් සනාථ කළ යුතුය).

7. කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

අවම උස අඩි 5 අඟල් 2 ½ ක් විය යුතුය.

සෑම අපේක්ෂකයෙකුම මනා ඇස් පෙනීමක් තිබිය යුතු අතර, දිවා කාලයේදී හා රාත්‍රී කාලයේදී සේවයේ යෙදීම පිණිස ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත වීම.

8. තෝරා ගැනීමේ ක්‍රමය : අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට හා යෝග්‍යතා පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ.

සේවාව සපයා ගැනීමට තෝරාගනු ලබන අය පහත කොන්දේසිවලට යටත්ව සේවයේ යොදවා ගැනීම සිදු කරනු ලැබේ.

1. ඕනෑම සේවා මුරයක රාජකාරි කිරීමට එකඟ විය යුතුය.
2. පූර්ණ කාලීනව රාජකාරීන්හි නියැලිය යුතුය.
3. සේවා සැපයීමට අදාල අවු: 1 ක කාල සීමාවක් සඳහා සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර සේවා අවශ්‍යතාවය මත මෙම කාල සීමාව දීර්ඝ කරනු ලැබේ.

9. වෙනත් සුදුසුකම් :

* අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය. මහනුවර නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු විය යුතුය. (සුදුසුකම් සැපිරූ අයදුම්කරුවන් නොමැති වුවහොත් නගර සීමාවෙන් බාහිර අයදුම්කරුවන් පිළිබඳව සලකා බැලේ.)
* බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
* අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**02.** ජල පොම්ප ක්‍රියාකරු සේවාව ලබාගැනීම සඳහා

1. තනතුරු සංඛ්‍යාව : තනතුරු 05

2. වයස : සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

3. දීමනාව : දෛනික දීමනාව රු. 1,986.66 කි. (මාසයකට අවම දින 25ක් රාජකාරි කළ යුතුය)

4. අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසයෙහින් සම්මාන 2ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම, මින් විෂයයන් 05ක් එකවර සමත්වී තිබිය යුතුය.

5. වෘත්තීය සුදුසුකම් : NVQ 3 හෝ ඊට ඉහළ මට්ටමේ විදුලි කාර්මික ශිල්පී / යාන්ත්‍රික ශිල්පී හෝ ආශ්‍රිත පාඨමාලාව හදාරා තිබීම.

6. පළපුරුද්ද : ක්ෂේත්‍රයට අදාළ අවම වසරක පළපුරුද්දක් ලබා තිබීම (පළපුරුද්ද සහතික මගින් සනාථ කළ යුතුය).

7. කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

8. තෝරා ගැනීමේ ක්‍රමය : අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට හා යෝග්‍යතා පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ.

සේවාව සපයා ගැනීමට තෝරාගනු ලබන අය පහත කොන්දේසිවලට යටත්ව සේවයේ යොදවා ගැනීම සිදු කරනු ලැබේ.

1. ඕනෑම සේවා මුරයක රාජකාරි කිරීමට එකඟ විය යුතුය.
2. පූර්ණ කාලීනව රාජකාරීන්හි නියැලිය යුතුය.
3. සේවා සැපයීමට අදාල අවු: 1 ක කාල සීමාව සඳහා සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර සේවා අවශ්‍යතාවය මත මෙම කාල සීමාව දීර්ඝ කරනු ලැබේ.

9. වෙනත් සුදුසුකම්

* අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය. මහනුවර නගර සහා බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු විය යුතුය. (සුදුසුකම් සැපිරූ අයදුම්කරුවන් නොමැති වුවහොත් නගර සීමාවෙන් බාහිර අයදුම්කරුවන් පිළිබඳව සලකා බැලේ.)
* බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
* අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

10. සේවාව මගින් ඉටු කර ගැනීමට අපේක්ෂිත කාර්යභාරය :

1. පාරිභෝගිකයින් වෙත බාධාවකින් තොරව ජලය බෙදා හැරීම;
2. යන්ත්‍ර සූත්‍ර හා පොම්පවල දෝෂ නිරීක්ෂණය කර අදාල අංශ වෙත දැනුම් දීම;
3. දෛනික ධාවන කාලයන් හා ජල මනු කියවීම් ලොග් පොත්වල නිවැරදිව සටහන් තැබීම එහි ප්‍රධාන වේ;
4. පොම්පාගාර පරිශ්‍රයේ පිරිසිදුකම හා ආරක්ෂාව තහවුරු කිරීම;
5. ඉන්වෙන්ට්‍රි භාණ්ඩ සුරැකීම;
6. විගණන කටයුතුවලදී සහාය වීම සහ හදිසි අවස්ථාවලදී ඉහළ නිලධාරින් හා ප්‍රධාන කාර්යාලය දැනුවත් කරමින් කටයුතු කිරීම.

**ජල මනු කියවන්නා සේවාව ලබා ගැනීම සඳහා**

1. තනතුරු සංඛ්‍යාව : තනතුරු 03

2. වයස : සියලුම අයදුම්කරුවන් අයදුම්පත් ඉදිරිපත් කරන දිනට වයස අවුරුදු 18ට නොඅඩු විය යුතු අතර අවුරුදු 40 ට නොවැඩි විය යුතුය.

3. දීමනාව : දෛනික දීමනාව රු. 1,926.66 කි. (මාසයකට අවම දින 25ක් රාජකාරි කළ යුතුය)

4. අධ්‍යාපන සුදුසුකම් : අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසයෙහින් ගණිතය විෂය ද ඇතුළත්ව සම්මාන 2ක් සහිතව විෂයයන් 06ක් සමත්ව තිබීම.

5. කායික සුදුසුකම් : තනතුරේ රාජකාරි ඉටු කිරීමට සෑම අයුරකින්ම ශාරීරික වශයෙන් යෝග්‍ය විය යුතුය.

6. තෝරා ගැනීමේ ක්‍රමය : අයදුම්පත් ඉදිරිපත් කර ඇති අයවළුන් අතරින් බඳවා ගැනීමට අවශ්‍ය මූලික සුදුසුකම් සහිත අයදුම්කරුවන් සියලු දෙනා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකට යොමු කරනු ලබන අතර, අවශ්‍ය සියලුම සුදුසුකම් පරීක්ෂා කිරීමෙන් අනතුරුව නිසි සුදුසුකම් සහිත අයදුම්කරුවන් තෝරාගෙන ඔවුන් ලබාගත් ලකුණු ප්‍රමුඛතාවය අනුව බඳවා ගනු ලැබේ.

සේවාව සපයා ගැනීමට තෝරාගනු ලබන අය පහත කොන්දේසිවලට යටත්ව සේවයේ යොදවා ගැනීම සිදු කරනු ලැබේ.

1. පූර්ණ කාලීනව රාජකාරීන්හි නියැලිය යුතුය.
2. සේවා සැපයීමට අදාල අවු: 1 ක කාල සීමාවක් සඳහා සේවා ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර සේවා අවශ්‍යතාවය මත මෙම කාල සීමාව දීර්ඝ කරනු ලැබේ.

8. වෙනත් සුදුසුකම් :

* අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය. මහනුවර නගර සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවෙකු විය යුතුය. (සුදුසුකම් සැපිරූ අයදුම්කරුවන් නොමැති වුවහොත් නගර සීමාවෙන් බාහිර අයදුම්කරුවන් පිළිබඳව සලකා බැලේ.)
* බඳවා ගැනීම සඳහා වන සියලු සුදුසුකම් අයදුම්පත් භාරගන්නා අවසන් දිනට සෑම ආකාරයෙන්ම සම්පූර්ණ කර තිබිය යුතුය.
* අයදුම්කරු විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

9. සේවාව මඟින් ඉටු කර ගැනීමට අපේක්ෂිත කාර්යභාරය:

1. තමන්ට පැවරෙන ප්‍රදේශයේ පාරිභෝගික ස්ථානය වෙත ගොස් නිවැරදිව ජලමනු කියවීම ලබාගෙන එදිනම පාරිභෝගිකයින්ට ජංගම දුරකථන වෙත කෙටි පණිවිඩ යොමු කිරීම.
2. අදාල වාර්තා සහ කාබන් පිටපත් පාරිභෝගික අත්සන සහිතව කාර්යාලය වෙත භාරදීම.
3. ජල භාවිතයේ අසාමාන්‍ය වෙනස්කම්, ගෘහස්ථ ජලය වෙනත් ව්‍යාපාරික කටයුතුවලට යොදා ගැනීම, අනවසර ජල සම්බන්ධතා සහ පාරිභෝගික පැමිණිලි පිළිබඳව ලිඛිතව ඉහළ නිලධාරින්ට වාර්තා කිරීම.
4. බිල්පත් දීමට නොහැකි වූ විට ඊට අදාල හේතු දැක්වීම
5. දෙපාර්තමේන්තු ආදායම් සුරක්ෂිත කරමින් ඉහළ නිලධාරින් විසින් විටින්විට පවරන අනෙකුත් සම්බන්ධිත රාජකාරි.

*සටහන :-*

මෙම සේවාවන්හි යොදවා ගැනීම සඳහා වන අයදුම්පත් මහනුවර මහා නගර සභාවේ www.kandy.mc.gov.lk වෙබ් අඩවියෙන් බාගත කර ගත හැක. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට අවශ්‍ය සියලු සුදුසුකම් සපුරා තිබිය යුතු අතර සේවය ලබා ගැනීම සම්බන්ධයෙන් අවසාන තීරණය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතු වේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවාගැනීම ප්‍රමාද කිරීම, වෙනස් කිරීම, මෙම නිවේදනය අවලංගු කිරීම, මෙම නිවේදනය සංශෝධනය කිරීම සම්බන්ධ පූර්ණ අයිතිය මහනුවර මහා නගර සභාවේ නාගරික කොමසාරිස් සතුය.

2026 සැප්තැම්බර් මස 25 වැනි දින.

ඒ. එච්. එම්. ඉන්දිකා කුමාරි අබේසිංහ,
නාගරික කොමසාරිස්,
මහනුවර මහා නගර සභාව.

ආදර්ශ අයදුම්පත්‍රය

මහනුවර මහා නගර සභාව සඳහා ශ්‍රම මිලදී ගැනීමේ පදනම මත ට්‍රැක්ටර් රථ රියදුරු/ලොරි රථ රියදුරු / ජල මනු කියවන්නා / ජල පොම්ප ක්‍රියාකරු සේවය ලබාගැනීම

**(අයදුම්කරනු ලබන තනතුර හැර අනෙකුත් තනතුරු තනි ඉරකින් කපා හරින්න)**

01. අයදුම්කරු අයත්වන පළාත් පාලන ආයතනය: ..........................................................................

02. (අ) මුලකුරු සමඟ නම (සිංහලෙන්) : ..........................................................................

(ආ) සම්පූර්ණ නම (සිංහලෙන්) : ..........................................................................

(ඇ) සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්): ..........................................................................

03. ජාතික හැඳුනුම්පත් අංකය

| | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | | | |

04. උපන්දිනය :- වර්ෂය : ....................මාසය: .................... දිනය: ....................

05. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට (2026.10.09 දිනට) වයස: අවුරුදු.................මාස................... දින......................

06. ස්ත්‍රී පුරුෂ භාවය : ..........................................................................

07. විවාහක / අවිවාහක භාවය : ..........................................................................

08. ස්ථිර ලිපිනය : ..........................................................................

09. දුරකථන අංකය : ..........................................................................

10. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? : ..........................................................................

එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචියෙන් ද? යන බව:..........................................................

11. අධ්‍යාපන සුදුසුකම්

11. (I) අ.පො.ස.(සාමාන්‍ය පෙළ) විභාගය

වර්ෂය : ....................
විභාග අංකය : ....................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |
| 05 | | |
| 06 | | |
| 07 | | |
| 08 | | |
| 09 | | |
| 10 | | |

11. (II) අ.පො.ස. (උසස් පෙළ) විභාගය

වර්ෂය : ....................
විභාග අංකය : ....................

| අනු. අංකය | විෂයය | ලබා ඇති ශ්‍රේණිය |
|---|---|---|
| 01 | | |
| 02 | | |
| 03 | | |
| 04 | | |

11. වෙනත් අධ්‍යාපනික සුදුසුකම් පිළිබඳ තොරතුරු .
.......................................................................................................................................
.......................................................................................................................................

12. වෘත්තීය සුදුසුකම් හා සේවා පළපුරුද්ද :
.......................................................................................................................................
. .......................................................................................................................................
.......................................................................................................................................
.......................................................................................................................................

13. අයදුම්කරුගේ සහතිකය:

මා විසින් ඉහතින් සපයන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බවට මෙයින් සහතික කරමි. ඉහත තොරතුරු කිසිවක් අසත්‍ය බව මා මෙම තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා පත්කිරීම සඳහා නුසුදුස්සකු වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා වහාම සේවයෙන් පහ කිරීමට යටත්වන බවත් පැහැදිලිව දනිමි.

......................................
අයදුම්කරුගේ අත්සන.

දිනය :........................

09-234

# පළාත් පාලන නිවේදන

## වෙන්නප්පුව ප්‍රාදේශීය සභාව

### 2027 වර්ෂයේ අයවැය කෙටුම්පත

වෙන්නප්පුව ප්‍රාදේශීය සභාවේ 2027 වර්ෂය සඳහා වූ කෙටුම්පත් අයවැය ලේඛනය 2026 සැප්තැම්බර් 28 වන දින සිට 2026 ඔක්තෝබර් මස 16 වන දින තෙක් (රජයේ නිවාඩු දින හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ වෙන්නප්පුව ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී සහ උප සභා කාර්යාලවලදී මහජනතාවගේ පරීක්ෂාව පිණිස තබා ඇති බව ප්‍රාදේශීය සභා අයවැය සම්පාදන හා බලාත්මක කිරීමේ රීති වල 10.2(ආ) රීතියේ ප්‍රකාර මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ටී. බී. ඩී. ඇන්ටනි කුමාර්,
සභාපති,
ප්‍රාදේශීය සභාව, වෙන්නප්පුව.

2026 සැප්තැම්බර් මස 17 වන දින,
ප්‍රාදේශීය සභා කාර්යාලය, වෙන්නප්පුව.

09-255

---

## මහව ප්‍රාදේශීය සභාව

### මහව ප්‍රාදේශීය සභාවේ 2027 කෙටුම්පත් අයවැය ඇස්තමේන්තුව මහජන නිරීක්ෂණය සඳහා අවස්ථාව සලසා දීම

මහව ප්‍රාදේශීය සභාවේ 2027 වර්ෂයට අදාළ කෙටුම්පත් අයවැය ඇස්තමේන්තුව 2026 සැප්තැම්බර් 22 දින සිට සැප්තැම්බර් 30 දින දක්වා (රජයේ නිවාඩු දින හා ඉරිදා දින හැර) කාර්යාල වේලාව තුළ මහව ප්‍රාදේශීය සභාවට අයත් පුස්තකාලවල මහජනතාවගේ නිරීක්ෂණය සඳහා තබා ඇති බව ප්‍රාදේශීය සභා අයවැය සම්පාදනය හා බලාත්මක කිරීමේ රීතිවල 10.2 (ආ) රීතිය ප්‍රකාරව ප්‍රදේශයේ මහජනතාව වෙත මෙයින් නිවේදනය කරමි.

ඒ. එම්. පී. ආර්. එස්. කේ. හේරත්,
සභාපති,
මහව ප්‍රාදේශීය සභාව.

09-319